ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

සන්නිවේදන දෙපාර්තමේන්තුව
30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
දුරකථන අංක: 2477424, 2477423, 2477311
ෆැක්ස්: 2346257, 2477739
ඊ-මේල්: dcommunications@cbsl.lk, communications@cbsl.lk
වෙබ් අඩවිය: www.cbsl.gov.lk

# පුවත්පත් නිවේදනය

| නිකුත් කළේ | ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව |
|---|---|
| දිනය | 2012 සැප්තැම්බර් මස 18 වැනි දින |

## මුදල් ප්‍රතිපත්ති විවරණය - 2012 සැප්තැම්බර්

ආනයන සහ ණය සඳහා වූ ඉහළ ඉල්ලුම අඩුකිරීම අරමුණු කොටගෙන මෙම වසර මුලදී මහ බැංකුව සහ රජය විසින් ගන්නා ලද ඒකාබද්ධ ප්‍රයත්නයන්හි අපේක්ෂිත ප්‍රතිඵල ලැබෙමින් පවතී. මෙලෙස ගනු ලැබූ ප්‍රතිපත්ති ක්‍රියාමාර්ගයන්හි බලපෑම පිළිබිඹු කරමින් 2012 දෙවන කාර්තුවේ සිට පෞද්ගලික අංශය විසින් ලබාගත් ණය ප්‍රමාණය ක්‍රමයෙන් අඩු වූ අතර, දැනට පවතින ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග වසර අවසානය වන විට ණය වර්ධනය අභිමත මට්ටම තුළ පවත්වා ගැනීමට උපකාරී වනු ඇතැයි අපේක්ෂා කෙරේ. පළමු මාස තුනෙහි රුපියල් බිලියන 52 ක් පමණ වූ සාමාන්‍ය මාසික ණය ප්‍රසාරණය සමඟ සැසඳීමේ දී, 2012 අප්‍රේල් මාසයේ සිට ජූලි මාසය දක්වා වූ කාලසීමාව තුළ දී සාමාන්‍ය මාසික ණය ප්‍රසාරණය රුපියල් බිලියන 27 ක් පමණ දක්වා අඩු විය. මෙම අඩුවීමෙහි ප්‍රතිඵලයක් ලෙස, මෙම වසරේ ප්‍රථම වතාවට, පුළුල් මුදල් හි වර්ධනය ජූලි මාසයේ දී සියයට 20 කට වඩා අඩු අගයක් ගත්තේය. එසේ නමුත්, දැනට පවතින ණය ප්‍රමාණය ආර්ථික කටයුතු බොහෝදුරට ශක්තිමත්ව පවත්වා ගැනීමට ප්‍රමාණවත් වූ අතර, ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ ඇස්තමේන්තුවලට අනුව, වසරේ ප්‍රථම භාගය තුළදී ආර්ථිකය සියයට 7.2 ක ශක්තිමත් වර්ධනයක් වාර්තා කරන ලදී.

දේශීය ආහාර සැපයුමට පැවති බාධාවන් හේතුවෙන් ජූනි සහ ජූලි මාසවලදී ඉහළ ගිය උද්ධමනය එම තත්ත්වය ලිහිල් වීම හේතුකොටගෙන අගෝස්තු මාසයේ දී වාර්ෂික ලක්ෂ්‍යමය වෙනස අනුව සියයට 9.5 ක් දක්වා යම්තාක් දුරකට පහත ගියේය. LP ගෑස් වැනි ඇතැම් පරිපාලිත මිල ගණන් පහළ දැමීම මෙන්ම තෝරාගත් ආහාර ද්‍රව්‍ය මත වූ බදු හා අයකිරීම් සංශෝධනය කිරීම, සැපයුම් අංශයේ කම්පනයන් තුළින් තාවකාලිකව උද්ධමනයෙහි සිදුවන ඉහළයාම යම්තාක්දුරකට සමනය කිරීමට අවකාශය සලසනු ඇතැයි අපේක්ෂා කෙරේ. අධිකාරීන් විසින් අනුගමනය කරන ලද ඉල්ලුම් කළමනාකරණ ප්‍රතිපත්ති හේතුවෙන් ඉදිරි කාලයේ දී උද්ධමනය තනි අංකයක පවත්වාගෙන යාමට හැකිවනු ඇතැයි අපේක්ෂා කෙරේ.

අපනයන වර්ධනයෙහි අඩුවීම ඉක්මවා යමින් අප්‍රේල් මාසයේ සිට ආනයන වර්ධනය සැලකිය යුතු ලෙස අඩුවීම වෙළෙඳ හිඟය අඛණ්ඩව අඩු කිරීමට හේතු වූ අතර, මෙම වර්ධනය මෙන්ම විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ ලැබීම් දිගින් දිගටම පැවතීමත්, සංචාරක ඉපැයුම් වර්ධනය වීමත්, වර්තන ගිණුමේ හිඟය අඩු කිරීමට උපකාරී විය. තවද, ආයෝජක විශ්වාසය වර්ධනය වීමේ ප්‍රතිඵලයක් ලෙස 2012 සැප්තැම්බර් මැද දක්වා කොළඹ කොටස් වෙළෙඳපොළ වෙත පැවැති සමුච්චිත ශුද්ධ ලැබීම් එ.ජ.ඩොලර් මිලියන 229 ක් වූ අතර, ජූලි මාසයේ දී නිකුත් කරන ලද පස්වැනි ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කරය සහ එම කාලසීමාවේදීම රජයේ සුරැකුම්පත් මත සිදුකළ එ.ජ.ඩොලර් මිලියන 1,725 ක වටිනාකමින් යුතු විදේශීය ආයෝජන ජූලි මස අවසානය වන විට දළ නිල සංචිතය එ.ජ.ඩොලර් බිලියන 7 ඉක්මවා යමින් විදේශීය අංශය තුළ වූ පීඩනය සමනය කිරීමට උපකාරී විය.

ඉහත සඳහන් කරන ලද වර්ධනයන් පිළිබඳව සැලකිල්ලට ගනිමින්, ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලයෙහි මතය වූයේ දැනට පවත්නා මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය අපේක්ෂිත ප්‍රතිඵල ලබාගැනීමට උචිත අයුරින් පවතින බවයි. ඒ අනුව 2012 සැප්තැම්බර් 17 වැනි දින පැවති මුදල් මණ්ඩල රැස්වීමේදී මහ බැංකුවේ ප්‍රතිපත්ති පොලී අනුපාතික දැනට පවතින මට්ටමේම නොවෙනස්ව පවත්වා ගැනීමට තීරණය කරන ලදී. ඒ අනුව ප්‍රතිමිලදීගැනුම් අනුපාතිකය සියයට 7.75 ක් සහ ප්‍රතිවිකුණුම් අනුපාතිකය සියයට 9.75 ක් ලෙස පවතිනු ඇත.

මීළඟට නියමිත මුදල් ප්‍රතිපත්ති ප්‍රකාශය සිදුකරනු ලබන දිනය යථා කාලයේ දී ප්‍රකාශයට පත්කරනු ඇත.